**මම" "අපි" යෙදුණු වර්තමාන කාල වාක්‍ය**

**පහත වාක්‍ය කියවන්න**

| **මම** | **අපි** |
|---|---|
| මම ගෙදර යමි. | අපි ගෙදර යමු. |
| මම මුහුණ සෝදමි. | අපි මුහුණ සෝදමු. |
| මම පොත කියවමි. | අපි පොත කියවමු. |
| මම උදේ ආහාරය ගනිමි. | අපි උදේ ආහාරය ගනිමු. |
| මම බත් කමි. | අපි බත් කමු. |

"මම" යනුවෙන් වාක්‍යයක මුලට යෙදේ නම් වර්තමාන කාල ක්‍රියා පදය "මි" අකුරෙන් අවසන් වේ.

"අපි" යන වචනය වාක්‍යයක මුලට යෙදේ නම් වර්තමාන කාල ක්‍රියා පදය "මු" අකුරෙන් අවසන් වේ.

පහත වාක්‍ය බහු වචනයට හරවා ලියන්න?

1) මම හොඳින් ඉගෙන ගනිමි.

2) මම නිතර ම පොත් කියවමි.

3) මම දිනපතා බුදුන් වඳිමි.

4) මම අම්මාට උදව් කරමි.

5) මම සරුංගලයක් සාදමි.

- පහත වාක්‍ය ඒක වචනයට හරවා ලියන්න

1) අපි සෙල්ලම් කරමු.

2) අපි පරිසරයට ආදරය කරමු.

3) අපි වල් පැළ ගළවමු .

4) අපි කතන්දරයක් අහමු.

5) අපි තාලයට නටමු.